# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය**

## කතෝලික ධර්මය - II

නම/ විභාග අංකයෘ ........................................ කාලය පැය 2 යි

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04කට පිළිතුරු ලියන්න.**

01)

i. ශුද්ධ බයිබලයේ ප්‍රධාන කර්තෘ හා උපකාරක කර්තෘ නම් කරන්න.
ii. ශුද්ධ වූ පාවුලු තුමා ලිපි ලිවීමේ පරමාර්ථ දෙකක් ලියන්න.
iii. ශුද්ධ පේදුරුතුමාගේ දේශනයේ අඩංගු කරුණු දෙකක් ලියන්න.
iv. ශුද්ධ වූ සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න.
v. දසපනත බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න.
vi. බලාපොරොත්තුවට විරුද්ධ පාප දෙක ලියන්න.
vii. ජන වන්දනාවේ ප්‍රධාන අංග දෙකක් ලියන්න.
viii. උත්තම පූජක යැදුමේ ඇතුළත් ප්‍රධාන අංග දෙකක් ලියන්න.
ix. කිතුණු විවාහයේ පරමාර්ථ දෙක ලියන්න.
x. මිනිස් දිවියේ උතුම්කම විදහා දක්වෙන කරුණු දෙකක් ලියන්න.

02)

i. ශු. බයිබලයේ එළිදරව්ව සාහිත්‍ය තුළ දැකිය හැකි සංකේත භාවිතයේ පරමාර්ථ දෙකක් ලියන්න.
ii. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ තුනක් ලියා එමඟින් ඉදිරිපත් වන ප්‍රධාන අදහස බැගින් ලියන්න.
iii. ආගමික සංකේත හා දේව පණිවිඩය අපට ලබා දෙන්නා වූ උතුම් සළකුණුය. එම සංකේත වත්මන් සමාජය තුළ නවීන විලාසිතා හා මෝස්තර සඳහා යොදා ගැනීමෙන් සිදුවන අයහපත පිළිබඳව කරුණු පහක් ඇතුළත් කරමින් ආගමික සඟරාවකට ලිපියක් ලියන්න.

03)

i. පාස්කු අභිරහස යනු කුමක්ද?
ii. උත්ථාන වූ ක්‍රිස්තුන්වහන්සේ පාස්කු ඉරුදින අපෝස්තුලුවරුන්ට දර්ශනය වෙමින් ප්‍රකාශ කළේ කුමක්ද?
iii. සකල මහිමයෙන් පිරි ස්වර්ග රාජ්‍යයේ දී උත්ථාන වූ ජේසුස් වහන්සේව දැකීමට මනස්ථාපයෙන් යුතුව දිවිගෙවිය යුතුය. පාපි මඟ හැරයමින් යහපත් දිවියක් ගත කිරීමට අවශ්‍ය පිහිට පතා දෙවිපියාට කරන යැදුමක් ලියන්න.

04)

i. ඊශ්‍රායෙල් දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න.
ii. ප්‍රධාන දිවැසිවරුන් තිදෙනා නම් කරන්න.
iii. ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ කිතුනු සිසුවකු වන ඔබ ද දිවැසිවර කාර්යයට තෝරා පත්කර ගෙන ඇත. එම දිවැසිවර කාර්යය ඉටුකිරීම සඳහා පාසල, නිවස, පල්ලිය හා සමාජය තුළදී ඔබට ක්‍රියා කළ හැකි ආකාරයන් පහක් ලියා විස්තර කරන්න.

05)

i. දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් දෙකක් ලියන්න.

ii. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග තුනක් ලියන්න.

iii. දිව්‍ය පූජාවේ යථාර්ථය වන ප්‍රේමය හා සේවය ක්‍රියාවට නංවමින් ජීවත් වීමට ඔබට කළ හැකි ක්‍රියාවන් පහක් ලියා විස්තර කරන්න.

06)

i. ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක ලියන්න.

ii. මෙම ප්‍රසාද නිධාන දෙක සෙසු දේව ප්‍රසාද නිධානවලින් වෙනස් වන ආකාර තුනක් ලියන්න.

iii. පූජා ප්‍රසාදින් වහන්සේලා වෙනුවෙන් ගිහියන්ගේ යුතුකම් පහක් ලියා එය ඉටුකරන ආකාරය විස්තර කරන්න.

07)පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
(පේළි 12ක් පමණ)

i. කල්වාරි යාගය

ii. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා සිරිලකට කල සේවය

iii. ආශිර්වාදකාර බන්ධනයේ දේව ප්‍රසාද නිධානය

iv. ස්නාවක ජොහාන් තුමා